TRANSPARENCY INTERNATIONAL SRI LANKA
a nation that upholds integrity

No. 5/1, Elibank Road, Colombo 05, Sri Lanka
Tele : (94) 11 4369781, 11 4369782, 11 4369783
Fax : (94) 11 2 501 707
Email : tisl@tisrilanka.org
Web: www.tisrilanka.org

පොදු දේපල දේපල සුරකීමේ වැඩසටහන,
ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය,
5/1, එලිබෑන්ක් පාර, කොළඹ 5,

22 ඔක්තෝබර් 2019.

මහින්ද දේශප්‍රිය මහතා,
සභාපති,
ශ්‍රී ලංකා මැතිවරණ කොමිෂන් සභාව,
රාජගිරිය.

මහත්මයාණෙනි,

<u>පහසුකම්, ප්‍රදාන ලබා දීමේ වැඩසටහනක් සම්බන්ධයෙන් පැමිණිලි කිරීම සම්බන්ධවයි.</u>

2019 ඔක්තෝබර් 11 දින එක්සත් ජාතික පක්ෂයේ පාර්ලිමේන්තු මන්ත්‍රී ඉම්රාන් මහරුෆ් මහතා විසින් කින්නියා ප්‍රදේශයේ පාසල් 04ක (අල් අර්ෆාන් ප්‍රාථමික විදුහල, කුරුංඥන්කේනි අර්ෆා මහා විද්‍යාලය, කුරුංඥන්කේනි බාලිකා මහා විද්‍යාලය, සක්කාරයියා විද්‍යාලය) පරිහරණයට ඡායා පිටපත් යන්ත්‍ර එක බැගින් පරිත්‍යාග කර තිබූ බව ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල් ශ්‍රී ලංකා ආයතනයේ ත්‍රිකුණාමලය දිස්ත්‍රික් මැතිවරණ නිරීක්ෂක අප වෙත වාර්තා කරන ලදී. මීට අදාළ ඡායාරූප මේ සමඟ අමුණා ඇත.

ඡායා පිටපත් යන්ත්‍ර මෙසේ ප්‍රදානය කිරීම මගින් එක් විශේෂ දේශපාලන පක්ෂයක් හෝ අපේක්ෂකයෙක් ප්‍රවර්ධනය වීමේ හැකියාව ඇති අතර 2019 සැප්තැම්බර් 19 අංක 2141/52 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ අංක 4 (iii) යන නියමයන් ද උල්ලංඝනය වන බැවින් මෙම කරුණ සම්බන්ධයෙන් වැඩිදුරටත් සොයාබලා අවශ්‍ය වන්නේ නම් නිසි පියවර ගන්නා මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

මේ සම්බන්ධයෙන් වැඩිදුර තොරතුරු දැනගැනීම සඳහා නැගෙනහිර පළාත් සම්බන්ධීකාරක කවීන් හෙට්ටිආරච්චි මහතා හෝ ජාතික සම්බන්ධීකාරක ලක්විජය බණ්ඩාර මහතා හෝ 0763223442/0763223662 යන දුරකථන අංක ඔස්සේ සම්බන්ධ කරගන්නා මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය (TISL) යනු දූෂණයට එරෙහි ගෝලීය ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ව්‍යාපාරයේ ස්වාධීන දේශීය ශාඛාවයි. පොදු දේපල සුරැකීමේ වැඩසටහන (PPPR), මැතිවරණ සමයේ දී පොදු දේපල අවභාවිතා වීම වැළැක්වීම සඳහා ක්‍රියාත්මක වන ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනයේ මැතිවරණ නිරීක්ෂණ වැඩසටහනයි.

ස්තුතියි.

මෙයට,


විශ්වාසී,

Lakvijaya Bandara


ලක්විජය බණ්ඩාර


ජාතික සම්බන්ධීකාරක (PPPR)

Reg No. GA 279 Chairperson: S.C.C. Elankovan Directors: Anushika Amarasinghe Shyamala Gomez Camena Guneratne Pavithra Kailasapathy
Company Secretary: Charuni Gunawardana Shreen Saroor T. Someswaran Tony Senewiratne Pulasthi Hewamanna








KURINCHAKERNY ARAFA MAHA VI AYAM
2019